**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව -2010 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.
1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව
2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |

**2. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැසුම් ගිණුම් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර තිබුණි.

**3. ගිණුම්**

**3.1 විසර්ජන ගිණුම**

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවට අදාල විසර්ජන ගිණුම 2011 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි. පහත සඳහන් ගිණුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අමාත්‍යාංශය | විසර්ජන ශීර්ෂය | ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 139 | 2011 අප්‍රේල් 04 |

**(ආ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේනතුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 6,600,896,130 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 5,296,325,414 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගේ ඉතිරිවීම් රු.1,303,365,149 ත් රු.1,205,567 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 19.74% ත් 0.02% අතර පරාසයක පැවැතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 535,649,800 | 5,811,191,330 | 528,865,844 | 4,514,610,137 | 6,783,956 | 1,296,581,193 |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 216,330,000 | 37,725,000 | 215,838,776 | 37,010,657 | 491,224 | 714,343 |
| | එකතුව | 751,979,800 | 5,848,916,330 | 744,704,620 | 4,551,620,794 | 7,275,180 | 1,297,295,536 |

## (ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත පහත සඳහන් පරිදි එකතුව රු. 2,884,334 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ලබා දුන් ප්‍රතිපාදන | තථ්‍ය වියදම | ඉතිරිය (2010 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 1,057,500 | 1,057,500 | - |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 878,884 | 878,884 | - |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 400,000 | 400,000 | - |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 350,000 | 220,032 | 129,968 |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 197,950 | 197,950 | - |
| **එකතුව** | 2,884,334 | 2,754,366 | 129,968 |

## 3.2 ආදායම් ගිණුම්

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල 2010 වර්ෂය සඳහා ආදායම් සංකේතයකට අදාලව පිළියෙල කළ යුතුව තිබුණු ආදායම් ගිණුම් සංඛ්‍යාව එකක් විය. 2011 මාර්තු 31 දින වන විට ආදායම් ගිණුම විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### (ආ) ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂයේදී ආදායම් සංකේත 1 ක් සඳහා රු. මිලියන 16 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර රු. මිලියන 17.16 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් 107.2% ක ප්‍රතිශතයක ආදායම රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන් දීමේ නිලධාරි | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත රු. | තථ්‍ය රු. | වැඩියෙන් එකතු කිරීම රු. | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් | 10-03-07-06 | 16,000,000 | 17,164,508 | 1,164,508 | 7.2 |

## 3.3 අත්තිකාරම් ගිණුම්

### 3.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් දෙක 2011 අප්‍රේල් 05 හා 2011 මාර්තු 29 යන දිනයන්හිදී විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### (ආ) සමා පිළිපැදීම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණි.

## 3.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 3.4.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් වල රු.45,133,795 ක්වූ බැර ශේෂ තිබුණු අතර එම ශේෂ වර්ෂ 01 ට අඩු කාලපරිච්ඡේදයට අයත් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2010 දෙසැම්බර් 31දිනට ශේෂය බැර |
|---|---|
| | රු. |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 44,952,922 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 180,873 |

### 3.4.2 පොදු තැන්පත් ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු.8,872,885 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | කාල විශ්ලේෂණය | | | 2010 දෙසැම්බර් 31දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2 ට අඩු | වර්ෂ 2 ට වැඩි 5 ට අඩු | |
| | | රු. | රු. | රු. | රු. |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 6000/0/0/15/51-1 | 2,161,711 | 4,062,264 | - | 6,223,975 |
| | 6000/0/0/3/570-1 | - | - | 2,123,900 | 2,123,900 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 6000/0/0/6/73 | 525,010 | - | - | 525,010 |

## II කොටස

## එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

### 1. විසර්ජන ශීර්ෂය 139 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 දෙසැම්බර් 16 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනවල තත්ත්වය ප්‍රකාශ වන, මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.10 දක්වා වූ ඡේදවල ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

(i) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණු බැවි නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| හානි ලේඛනය | මු.රෙ. 110 | අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යනු ලබන හානි ලේඛණයේ කිසිදු සටහනක් ඇතුළත් කර නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලෙඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ 842 | වාර්ෂිකව නිසි පරිදි තුලනය කිරීම් කර නොතිබූ අතර අපහරණයන් සටහන් කර නොතිබුණි. |

(ii) විසර්ජන ගිණුමේ දැක්වෙන වියදම හා ඉතිරිය, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ දැක්වෙන වියදම හා ඉතිරිය සමඟ සැසදීමේදි වැය විෂයන් 11 ක වියදම රු.572,082,827 ක් අඩුවෙන් දක්වා තිබූ අතර භාණ්ඩාගාරය විසින් තැන්පතු ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදනයට අදාල වටිනාකම එම වැය විෂයයන්ට හර කිරීම නිසා විසර්ජන ගිණුමේ දක්වා ඇති වියදමට වඩා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ වියදම වැඩියෙන් දක්වා තිබුණි.

**(ආ) අයවැය විචලනය**

(i) ශීර්ෂ 139 යටතේ විසර්ජන ගිණුම අනුව වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු රු. 212,760,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 25% ත් 99% අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

(i). 2011 අප්‍රේල් 30 දින වන විට අමාත්‍යාංශය පියවා නොතිබුණු අග්‍රිම ශේෂවල එකතුව රු. 44,952,923 ක් වී තිබුණි. එම ශේෂ 2010 වර්ෂය තුල වු ශේෂ විය.

(ii). නොපියවු අග්‍රිම ශේෂයේ අමාත්‍යාංශය විසින් ලබාදී නොපියවු අත්තිකාරම් රු. 10,662,243 ක් හා සුනාමියෙන් හානියට පත් ප්‍රදේශ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට ලබාදී තිබූ නොපියවු රු.23,432,038 ක ශේෂයක් ද විය.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 13901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2010 දෙසැම්බර් 31 දින වන විට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 946,221 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|
| (i) මෝටර් වාහන | 02 | වසර 02 |
| (ii) යන්ත්‍ර සූත්‍ර | 39 | - |

### (ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් ඒකක ගණන | වත්කම් ලබා දී ඇති ආයතනය | වටිනාකම රු. | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| මොටර් වාහන | 03 | ප්‍රධාන ලේකම් වයඹ පළාත | | |
| | 10 | ලංකා ධීවර සංස්ථාව | - | වසර 02 |
| | 03 | සීනෝර් පදනම | | |
| | 02 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | | |

### (ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයත් මෝටර් වාහන 03 ක් වර්ෂ 02 ක කාලයක සිට විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබූ බව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

### (ඈ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2010 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන බේරුම් නොකළ බැරකම් රු.7,900,197 ක් විය.

## 1.5 අනුකූල නොවීම්

### නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ආයතන සංග්‍රහය** | | |
| | XXIV පරිච්ඡේදයේ 4.1 හා 4.2 වගන්තිය | 225,769 | විශ්‍රාම යාමට නියමිත නිලධාරීන්ගේ ණය අය කිරීමට විධිවිධාන නොයෙදීම. |
| (ආ) | **මුදල් රෙගුලාසි** | | |
| | මු.රෙ. 104 | - | වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තා හා සම්පූර්ණ වාර්තා සකස් කොට නොතිබුණි. |
| | මු.රෙ. 1645 | - | සියළුම වාහන සඳහා පොදු 267 ආකෘති පත්‍රය සම්පූර්ණ කර පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | **වෙනත් චක්‍රලේඛ විධිවිධාන** | | |
| (i) | ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ | | |
| | CSA/PI/40 2006 ජනවාරි 04 දින | | අමාත්‍යවරයෙකුට වාහන 02 ක් ද ඔහුගේ කාර්ය මණ්ඩලයට වාහන 05 ක් ද නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට වාහන 02 ක් ද හා ඔහුගේ කාර්ය මණ්ඩලයට වාහන 03 ක් ද හිමි වන අතර අමාත්‍යවරයා විසින් වාහන 07 ක් ද කාර්ය මණ්ඩලය විසින් වාහන 09 ක් ද නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් වාහන 04 ක් ද හා ඔහුගේ කාර්ය මණ්ඩලය විසින් වාහන 03 ක් ද වශයෙන් චක්‍රලේඛයට පටහැණිව වාහන 11 ක් භාවිතා කර තිබුණි. |
| (ii) | **ජාතික අයවැය චක්‍රලේඛ** | | |
| | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛය | 153,526 | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් වර්ෂ 25 කට අධික කාලයක සිට ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

## 1.6 පාඩු හා හාන

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත දක්වා ඇති පාඩු හා හානි සිදුවූ අවස්ථා නිරීක්ෂණය විය.

විසර්ජන ගිණුමේ පාඩු පිළිබඳ ප්‍රකාශයේ වැඩසටහන් අංක 01 හා 02 යටතේ රු. 25,000 ට අඩු හෝ වැඩි වශයෙන් පාඩුවක් සිදු වී නොමැති බව දක්වා තිබුණ ද 2010 වර්ෂයේ වාහන 05 කට රු. 115,401 ක හානි සිදු වී තිබුණි.

## 1.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වු මෙහෙයුම් අකාර්යක්ෂමතා සම්බන්ධ සාරාංශයක් පහත දැක්වේ.

(අ) ධීවර සමූපකාර පුහුණු වැඩසටහන් ප්‍රතිපාදන යටතේ ධීවර ජනතාවගේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස චක්‍රීය ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු. 4,500,000 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. දිස්ත්‍රික් සමූපකාර සංගම් 06 ක රු. 1,862,590 ක් චක්‍රීය නොවී රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ධීවර අංශ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හික්කඩුව හා පානදුර ධීවර වරායන් සංවර්ධනය කිරීමට කොන්ත්‍රාත් සමාගමක් සමඟ 1997 දෙසැම්බර් 07 ගිවිසුමකට එළඹ තබුණි. ගිවිසුම අනුව ව්‍යාපාර පිරිවැටුම් බදු 8% අඩුකර ගෙවිය යුතු වුවත් භාණ්ඩ හා සෙවා බද්ද 12.5% ක් අඩු කර ගෙවා තිබුණි.ඒ අනුව සමාගම ගොනු කළ නඩුවේ තීන්දුවට අනුව පානදුර හා හික්කඩුව වරායන් වෙනුවෙන් පිළිවෙලින් රු. 4,783,457 හා රු. 10,315,440 ක් හා 9.25% පොලියක් සමඟ ගෙවිය යුතු බව තීරණය වී තිබුණි. ඒ අනුව වර්ෂ 08 ක කාලයක් සඳහා රු. 11,159,159 පොලියක් ගණනය කර තිබුණි. නඩු තීන්දුව අනුව එම මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් 2010 පෙබරවාරි 19 දින රු. 26,258,056 ක් ගෙවා තිබුණි.

## 1.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුලත්ව තිබුණු විගණන ඡේද රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මතු වූ කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් කරනු ලැබූ නිර්දේශ, බලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කෙරුණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය | රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේ දිනය | සභාවේ නියෝගය |
|---|---|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | | | |
| 2007 | 05 | මාදුගඟ සහ මීගමු කලපු ව්‍යාපෘතියේ ප්‍රතිපූර්ණ අයදුම්පත් සඳහා ගෙවීම් ප්‍රතික්ෂේප වීම | 2010 ඔක්තෝබර් 06 | රුපියල් මිලියන 73 ක ප්‍රතිපූර්ණ අයදුම්පත් සඳහා ගෙවීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ විස්තරාත්මක වාර්තාවක් සති දෙකක් තුල ඉදිරිපත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කරන ලෙස දැන්වීම. |
| | 08 | බහුදින හා එක් දින යාත්‍රා නිෂ්පාදනය සඳහා වූ ආධාර | 2010 ඔක්තෝබර් 06 | නෙදර්ලන්ත ආධාර යටතේ වූ බහුදින හා එක්දින යාත්‍රා නිෂ්පාදනය සඳහා වූ ආධාර වලින් ආපසු යවන ලද යාපනය දිස්ත්‍රික්කය සඳහා වෙන් කල ප්‍රතිපාදනය නැවත ලබා ගැනීමට ගන්නා ලද පියවර හා ඒ සඳහා පිළිතුරු වාර්තා කිරීම. |
| | 09 | දික්ඕවිට වරාය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව | -එම- | දික්ඕවිට වරාය ගිවිසුමේ වෙනස් කිරීම් හා ඒ පිළිබඳ එකඟවීම විගණකාධිපතිට වාර්තා කිරීම. |
| | 11 | වෙරළ උද්‍යානය ඉදිකිරීම. | -එම- | යෝග්‍යතා අධ්‍යයනයන් සඳහා වැය කිරීමෙන් අනතුරුව ගාල්ල දකුණු වෙරළ උද්‍යානය ඉදි කිරීම අත්හැර දැමීම සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම. |
| 2008 | 14 | කාර්ය මණ්ඩල ණය | -එම- | නිලධාරීනගේ අයකර ගත නොහැකි ණය කපා හැරීමේ හැකියාව පිළිබඳ භාණ්ඩාගාරයෙන් විමසීම. |
| | 18 | පාඩු ලේඛණය | -එම- | පාඩු රු.503,355 ක් ලේඛනගත කිරීම හා වර්තමාන තත්ත්වය වාර්තා කිරීම. |
| | 20 | එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩ සටහන | -එම- | එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනට පවරන ලද කාර්යයන් නිම කිරීමෙන් පසු වාර්තාවක් ඉදිරිපත් කිරීම. |

(ආ) නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) මවියාත්‍රා 02 ක් නිෂ්පාදනය කර මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදිත මුදලින් 98% හෙවත් රු. 135,805,870 ක් ඉතිරිවීම් ලෙස දක්වා තිබුණි. මෙම මවියාත්‍රා මිලදී ගැනීමට 2007 වර්ෂයේ තීරණය කර රු.300,000,000ක් ප්‍රතිපාදන වෙන්කර කොන්ත්‍රාත්කරුට සංචලිකරණ අත්තිකාරම් ලෙස රු. 65,203,200 ක් හා ණයවර ලිපි ගාස්තු ලෙස රු. 1,054,860ක් ගෙවා තිබුණි.තවද 2008 වර්ෂයේ රු.42,200,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු. 42,185,000 ක් පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබු අතර 2009 වර්ෂයේද රු.450,000ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2010 වර්ෂයේද රු. 138,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබු අතර එයින් ණයවර ලිපියේ කාලය දීර්ඝ කිරීම සඳහා රු. 2,181,630ක් ගෙවා තිබුණි 2007 ජුනි 26 දින රු.326,000,000 වටිනා මවියාත්‍රා 02ක් මිලදී ගැනීම සඳහා එළඹි ගිවිසුම අනුව අත්තිකාරම් ගෙවා දින 280ක් තුල කොන්ත්‍රාත්කරු විසින් යාත්‍රා නිෂ්පාදනය කර භාර දිය යුතු වුවත්, 2010 දෙසැම්බර් මස අවසානය දක්වා මවියාත්‍රා අමාත්‍යාංශයට ලබා ගෙන නොතිබුණි.

(ii) දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම හේතුවෙන් නිවාස අහිමි වූ පවුල් සඳහා මධ්‍යම ප්‍රමාණයේ නිවාස 06 ක්, පොකුරු නිවාස 14 ක් හා 04 ක් වශයෙන් පොකුරු නිවාස 18 ක් ඉදි කර භාර ද තිබූ අතර ඉදි කල පොකුරු නිවාස 14 හි මැද කොටසේ ඉර තැලීම් ඇති වීමෙන් එම නිවාස වල පදිංචිකරුවන්ට කුලී නිවාස ගාස්තු ගෙවීම, පරීක්ෂණ වාර්තා ගාස්තු හා නිවාස වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශයේ ඉහළ කළමනාකරණයේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් රු. 4,814,621 ක අතිරේක වැයක් දැරීමට සිදු වී තිබුණි.

(iii) දික්ඕවිට ධීවර වරාය ඉදි කිරීම හේතුවෙන් නිවාස අහිමි වූවන්ට නිවාස ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පුද්ගලික සමාගමක් වෙත රු.31,398,691 ක මුදලකට පවරා ඇති අතර නැවත සැලසුමේ වෙනස්වීමක් මත කොන්ත්‍රාත් අගය රු.32,956,834 කින් වැඩි වී තිබුණ අතර ඒ අනුව සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම රු.64,355,525 ක් විය. එනම් මුල් කොන්ත්‍රාත් වටිනාකම 105% කින් වැඩි වී තිබුණි. මෙම තත්ත්වය මත ප්‍රසම්පාදන අත්පොතේ 8.13 අනුව විචලනයන් 10% ක් ඉක්ම වූ විට තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව පිළිගත හැකි හේතු දක්වමින් අනුමැතිය ලබා දී නොතිබුණි.

(iv) දික්ඕවිට වරාය ඉදි කිරීම හේතුවෙන් නිවාස අහිමි වූවන් සඳහා වූ නිවාස ව්‍යාපෘතිය ඉදිකරන භූමියේ ජල රැඳවුම් ප්‍රදේශය පර්චස් 52 සිට 16.2 දක්වා අඩු කිරීම සඳහා භූමිය පිරවීමේදී අධි පිරිවැයක් දක්නට ලැබුණි.

| | පිරවුම් ප්‍රමාණය | ඒකක පිරිවැය<br>රු. | මුළු පිරිවැය<br>රු. |
|---|---|---|---|
| ඉංජිනේරු ඇස්තමේන්තු අනුව පර්චස් 52 ක් හැර ඉතිරිය පිරවීමට | 985 $m^3$ | 960 | 945,600 |
| නව යෝජිත තත්ත්වය අනුව පර්චස් 16.2 ක් හැර ඉතිරිය පිරවීමට | 14,225.85 $m^3$ | 1,500 | 21,338,775 |

පර්චස් 134 ක් පිරවීම සඳහා වූ 985$m^3$ ක් වෙනුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවක් අනුව කර තිබූ අතර අතිරේක පර්චස් 36 පිරවීම සඳහා අතිරේක 13,240.85$m^3$ ලෙස දක්වා තිබූ අතර ඒකක පිරිවැය රු. 960 සිට රු. 1500 දක්වා වූ වැඩිවීමක් වී තිබූ බව නිරීක්ෂණය විය.

## 1.9 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෂ්ඨ මට්ටම | 20 | 13 | 07 | 01 |
| (ii) තෘතියික මට්ටම | 07 | 05 | 02 | |
| (iii) ද්විතියක මට්ටම | 81 | 69 | 12 | |
| (iv) ප්‍රාථමික මට්ටම | 53 | 51 | 02 | |
| (v) වෙනත් (අනියම්) | | 03 | | |
| එකතුව | 161 | 141 | 23 | 01 |

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| (i) ද්විතියික මට්ටම | 2 | • මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය | 2005 දෙසැම්බර් 12 සිට ඉදිරියට |
| | | • ඉෆාඩ් ව්‍යාපෘතිය | 2007 ජූනි 01 -2012 මැයි 31 |
| (ii) ප්‍රාථමික මට්ටම | 2 | • වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2007 ජූලි 07 - 2010 ජූලි 07 |
| | | • ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 2010 ජූලි 08 සිට ඉදිරියට |
| | | • ඉෆාඩ් ව්‍යාපෘතිය | 2007 ජනවාර 01 සිට ඉදිරියට |

**(ඇ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් අවිධිමත් ලෙස ලබා ගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| මානව සම්පත් සංඛ්‍යාව | ලබාගත් ආයතනය | කාලපරිච්ඡේදය |
|---|---|---|
| ද්විතියක මට්ටම - 01 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | 2005 අප්‍රේල් 07 සිට ඉදිරියට |

## 1.10 අභ්‍යන්තර පාලනය

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

2000 මාර්තු 15 දින දරන අංක PF/PE/ 07 චක්‍රලේඛය සහ 2001 ජනවාරි 15 දින සහ අංක IAI/2001/1 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ වල විධිවිධාන වලට පටහැනිව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2010 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

.

## 2. විසර්ජන ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 නොවැම්බර් 29 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශනවල තතත්වය ප්‍රකාශ වන, මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.10 දක්වා වූ ඡේදවල ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛණ හා පොත්පත් පවත්වා නොතබීම**

(i) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛ 842 | ස්ථාවර වත්කම් ලේඛණය වාර්ෂිකව තුලනය කිරීම, අපහරණයන් සටහන් කිරීම් කර නොතිබුණි. |
| හානි හා පාඩු ලේඛනය | මු.රෙ.110 | (i).පාඩු පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ සිද්ධි 20 කට අදාල රු. 1,557,001 අයකර ගැනීමට මුදල රෙගුලාසි 104 ප්‍රකාර කටයුතු කර නොතිබුණි.<br><br>(ii).විසර්ජන ගිණුමේ දක්වා තිබූ අවස්ථා 3 කට අදාල රු.558,681 වූ පාඩු, ලේඛනයේ සටහන්කර නොතිබුණි. |
| හදිසි අනතුරු ලේඛනය | මු.රෙ.104 | වාහන අනතුරු හදිසි අනතුරු ලේඛණයේ සටහන් කර නොතිබූ අතර අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නොතිබුණි. |

**(ආ) ආදායම් ගිණුම්**

(i) ආදායම් රැස්කිරීමේ ලේඛණය මාසික ගිණුම් සාරාංශ සමග සැසදීමේදී මාස 04 ක ආදායම රු. 1,103,935 කින් මාසික ගිණුම් සාරාංශ වල අඩුවෙන්ද මාස 08 ක ආදායම රු. 812,476 ක් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ii) ආදායම් වෙන් වෙන්ව හඳුනා ගත හැකි වන ලෙස ඇස්තමේනතු සකස් කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 29001 දරන රජයේ නිලධාරීන්ට අතතිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2010 දෙසැම්බර් 31 දින වනවිට අයවීම් හිඟහිට තිබුණු ශේෂ වල එකතුව රු. 683,557 ක් වූ අතර,එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

### බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2010 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු කාලයක සිට පැවති බේරුම් නොකළ බැරකම් රු.3,186,132 ක් විය.

## 2.5 අනුකූල නොවීම්

### නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **මුදල් රෙගුලාසි** | |
| මු. රෙ. 1645 | වාහන 32 කට අදාළව ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි. |

## 2.6 කාර්යසාධනය

2010 වාර්ෂික ක්‍රියාකාර සැලසුමට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) සැලසුම් කිරීම සහ කාර්යසාධනය

(i) දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ක්‍රියාකාර සැලැස්ම හා ප්‍රගති වාර්තාවට අනුව 2010 වර්ෂය අවසානයේ පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| බලපත්‍ර ආදායම් වර්ගය | 2010 වාර්ෂික ඉලක්ක | 2010 වාර්ෂික ප්‍රගතිය | වෙනස |
|---|---|---|---|
| මිරිදිය ධීවර මෙහෙයුම් බලපත්‍ර නකුත් කිරීම | 3,300 | 1,918 | (1,382) |

| | | | |
|---|---|---|---|
| නව ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම් | 500 | 3,292 | 2,792 |
| වාර්ෂික ලියාපදිංචි අළුත් කිරීම් | 40,000 | 20,984 | (19,016) |
| මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම් | 42,200 | 31,566 | (10,634) |

(ii) 2010 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම අනුව වර්ෂය තුල අපේක්ෂිත ප්‍රථම ලියාපදංචි ධීවර යාත්‍රා ගණන 500 ක් ලෙස දක්වා තිබුණද , දිස්ත්‍රික් ධීවර කාර්යාල ලියාපදිංචිය පිළිබඳ උපලේඛන අනුව හා කාර්ය සාධන වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රථම ලියාපදිංචි වූ ධීවර යාත්‍රා ගණන 3292 ක් විය. මේ අනුව ක්‍රියාකාර සැලැස්ම නිසි අධ්‍යනයකින් තොරව පිළියෙළ කර තිබූ බව නිරීක්ෂණය විය.

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කල යුතු ශේෂ

2010 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු ප්‍රකාශයෙහි හදුනා නොගත් ලැබීම් ලෙස රු.1,804,186 ක් දක්වා තිබුණි.

## 2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ මෙහෙයුම් අකාර්යක්ෂමතා සම්බන්ධ සාරාංශයක් පහත දැක්වේ.

(i) විසර්ජන ගිණුමේ පාඩු පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ වාහනයක පාඩුව සම්බන්ධයෙන් මු.රෙ. 104 ප්‍රකාර පරීක්ෂණ නොපවත්වා වාහනය වෙන්දේසි කර තිබුණි.

(ii) මිරිදිය ධීවර සමිති සඳහා දැල් කට්ටල ලබාදීමේදී එම කර්මාන්තයේ නියුතු සුදුසු ප්‍රතිලාභීන් තෝරාගෙන ප්‍රතිලාභී ප්‍රමුඛතා ලේඛන සකස් කොට ඒ අනුව අවශ්‍ය දැල් කට්ටල සංඛ්‍යාව තීරණය කිරීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් 2010 අප්‍රේල් 01 දින රු.1,350,000 වැය කර දැල් කට්ටල 1000 ක් මිල දී ගෙන තිබුණි. මිරිදිය ධීවර කර්මාන්තය රට අභ්‍යන්තරයේ දිස්ත්‍රික්ක ගණනාවක ක්‍රියත්මක වන නමුදු හම්බන්තොට දිස්ත්‍රික්කයට පමණක් බෙදා හැරීමට තීරණය කර තිබුණි. 2011 මාර්තු වන විටත් දැල් කට්ටල 580 ක් බෙදාහැර නොතිබුණි.

## 2.9 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 01 | 04 |
| (ii) තෘතීයික මට්ටම | 66 | 43 | 23 |
| (iii) ද්විතියක මට්ටම | 473 | 413 | 60 |
| (iv) ප්‍රාථමික මට්ටම | 99 | 97 | 02 |
| එකතුව | 643 | 554 | 89 |

## 2.10 අභ්‍යන්තර පාලනය

### විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2000 මාර්තු 15 දින දරන අංක PF/PE/ 07 චක්‍රලේඛය සහ 2001 ජනවාරි 15 දින සහ අංක IAI/2001/1 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ වල විධිවිධාන වලට පටහැනිව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.